තේමාලිපි

# නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවා

*ලෝකයේ බොහෝ රටවල විවිධ සංවර්ධන අංශ මෙන් කෘෂි ව්‍යාප්ත සේවයද විවිධ ස්වරූප ගෙන ඇත්තේය. දිළිඳු බවෙහි ගිලී ගිය ජීවිත ගොවිජනතාවගේ නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීමට දැනුම ලබාදීම තුලින් ඇරඹුන මෙම සේවාව න්‍යායාත්මකව මෙන්ම ප්‍රායෝගික භාවිතයේද විවිධ අදියරයන් පසුකොට ඇත්තේය. සංවෘත ආර්ථික රටාවකින් ඇරඹී මෙම සේවය විවෘත ආර්ථික රටාවද ඉක්මවා ගොස් ගෝලීය කරණයට බඳුන්වී ඇති මෙම අවස්ථාවේදී මුහුණ දෙන ආකාරය විමසන ලිපියක් මේ.*

කෘෂිකර්ම සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
**ආචාර්ය ඩබ්.ජී. සෝමරත්න විසිනි**


## 1. හැඳින්වීම

සෑම රටකම ආර්ථික සංවර්ධනයේදී කෘෂිකාර්මික අංශය අනිකුත් කාර්මික හා සේවා අංශ සමගින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. සෑම කෘෂිකාර්මික ප්‍රතිපත්තියකම ප්‍රධානතම පරමාර්ථය වන්නේ කෘෂිකාර්මික නිෂ්පාදනය හා එහි ඵලදායිතාව වැඩි කිරීමට සමගාමීව නිෂ්පාදන ක්‍රියාවලියේ කර්යක්ෂමතාව (Efficiency) ඉහළ නැංවීමයි. මෙහිදී නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ වන සාධක හා නිෂ්පාදන ක්‍රියාවලියට අනියම් වශයෙන් සම්බන්ධවී එම ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩිකිරීම පහසු කරවන සාධක රාශියක් පවතී. කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීමේදී එම ක්‍රියාවලිය පහසු කරවන (Facilitating) කාර්යයන් අතුරින් එකකි. දියුණුවෙමින් පවතින බොහෝ රටවල කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව නිෂ්පාදකයින් සඳහා නොමිලයේ ලබාදෙන සේවාවක් වේ. එහිදී කෘෂිකාර්මික විද්‍යාත්මක දැනුම ඇති කිරීම, ව්‍යාප්ත කිරීම, හා භාවිතය යන කරුණුවලදී විශේෂයෙන් රාජ්‍ය අංශයේ මැදිහත්වීම දක්නට ලැබුණු අතර තවමත් එය එලෙසින්ම රාජ්‍ය අංශයේ විශේෂිත දෙපාර්තමේන්තු හා ආයතන මගින් ක්‍රියාත්මක වේ. මෙසේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම ලබා දීමේදී විශේෂයෙන් 1960 දශකය අග භාගයේදී කෘෂිකාර්මික ඵලදායිතාව වැඩි කිරීම සඳහා තාක්ෂණය යොදා ගැනීම අරමුණු කරගත් හරිත විප්ලවය ක්‍රියාත්මක විය. මෙම හරිත විප්ලවයෙන් ලබාගත් දැනුම හා තාක්ෂණය නිශ්පාදකයන්ට ලබාදීමේදී අවශ්‍ය දැනුම ඇති කිරීම සඳහා පර්යේෂණ ඇති කිරීමත්, අවශ්‍ය ආයතන බිහි කිරීමත්, පුහුණු වැඩසටහන් ඇති කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමත් සඳහා විවිධ වූ රාජ්‍ය ආයතන ජාලයන් පිහිටුවීම නිදහසින් පසු බලයට පත් සියළුම රජයන් විසින් ඉටුකරන ලදී.

## 2. සැපයුම මත පදනම් වූ කෘෂි ව්‍යාප්ති සේවා

නිදහසින් පසු බලයට පත් සෑම රජයකටම කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සැපයුමේදී වසරක් පාසා රටේ සම්පත් විශාල වශයෙන් ආයෝජනය කිරීමට සිදුවිය. කෘෂි ව්‍යාප්ති සේවා සැපයුම සඳහා විශාල වශයෙන් ආයෝජනය කිරීමට සිදුවීමත් හරිත විප්ලවයෙන් ඇතිවූ ප්‍රතිඵලත් නිසා ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඵලදායිතාව ඉහළ මට්ටමකට නංවා ගැනීමට හැකිවිය. මෙහිදී පුහුණුකිරීමේ හා පසු විපරම් කිරීමේ ක්‍රමය (Training and Visit System - TVS) වැදගත් කාර්යභාරයක් කෘෂි සංවර්ධනයේදී ඉටුකළ බවක් පෙනේ. එමගින් කෘෂිකර්ම අංශයේ, විශේෂයෙන් සහල් හා අතිරේක බෝග නිෂ්පාදනයෙහි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණි.

කල්යත්ම එක් අතකින් කෘෂි ව්‍යාප්ති සේවා එලෙසින්ම සැපයීමට අවශ්‍ය සම්පත් සපයා ගැනීමට බලයට පත් රජයන් අපොහොසත් වීමත්, අනෙක් අතට කෘෂිකාර්මික ඵලදායිතාව දිගින් දිගටම එකම මට්ටමක පැවතීමත් නිසා කෘෂි ව්‍යාප්ති සේවයද පසුබෑමකට ලක් විය. වර්තමානයේ





පිහිටුවන ලද ගොවි සෙවන, ව්‍යාපෘතියද කිසියම් ආකාරයක සාම්ප්‍රදායික ව්‍යාප්ති සේවා සැපයුම් ක්‍රියාවලියක් වේ.

**ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා අනුව, 1977 න් පසුව ලංකාවේ නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමගම රටේ බොහෝ අංශවල වර්ධනයේ ශීඝ්‍රතාවයක් ඇතිවිය. විශෙෂයෙන්ම කාර්මික හා සේවා සැපයුම් අංශ ඒවායින් ප්‍රධාන තැනක් ගනියි. නිදහස් වෙළඳපොළ ආර්ථික ක්‍රමයකදී පෞද්ගලික අංශය වර්ධනයේ එන්ජිම ලෙස සැලකුවත් පසුගිය අත්දැකීම් හා සසඳන විට ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයේදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය හා ආයෝජනය ඉතාමත් මන්දගාමීව සිදු කෙරී ඇත. මේ තත්ත්වයන් නිසා කෘෂි ව්‍යාප්ති සේවා, කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධනය (Research and Development) යන කටයුතුවලදී තවමත් ඔවුන්ගේ හැකියාව හා සහභාගිත්වය ලබා ගැනීම ඉතා අඩු මට්ටමක පවතින බව පෙනේ.**

මේ අන්දමින් බලන කල ලංකාවේ ආර්ථික සංවර්ධනයේ කොඳු නාරටිය කෘෂිකාර්මික අංශය වුවත් රාජ්‍ය අංශයට එහි වර්ධනය ඒ අයුරින්ම ගෙනයාම සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය සම්පත් ලබා ගැනීමට නොහැකි වීමත්, දියුණු තාක්ෂණය යොදා නොගැනීමත්, කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව පහත වැටීම නිසාත් විවිධ වූ ප්‍රශ්න රාශියකට මුහුණ දීමට සිදුවී ඇත. මෙම තත්ත්වය නිසාම කෘෂිකාර්මික අංශයේ ආයෝජනයේ ප්‍රතිලාභ පහත වැටීමක් නිරන්තරයෙන්ම පෙන්වයි. එමෙන්ම නැවත ආයෝජනයක් නොවීම තිරසාර සංවර්ධනයට බාධකයක්ව පවතී.

### 3. ඉල්ලුම මත පදනම් වූ කෘෂි ව්‍යාප්ති සේවා

ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයේදී කෘෂි ව්‍යාප්ති සේවා සඳහා වන ඉල්ලුම ගැනද සලකා බැලිය යුතුය. කෘෂි ව්‍යාප්ති සේවාවල අවශ්‍යතාව, අවශ්‍ය කාලය හා අවශ්‍ය තත්ත්වය පිළිබඳ වැටහීමක් අත්‍යාවශ්‍ය වුවත් බොහොමයක් දියුණු වෙමින් පවතින රටවල අත්දැකීම් අනුව සාම්ප්‍රදායික ව්‍යාප්ති සේවා සැපයුම් ක්‍රියාවලිය තවදුරටත් පවත්වා ගෙන යාමක් ලංකාවේද පෙන්වයි. මෙහිදී මතුවන ප්‍රශ්න කිහිපයකි. එක් අතකින් අවශ්‍යතාව ගැන නොසිතා කරන සැපයුම සම්පත් නාස්තියක් මෙන්ම එම සැපයුමෙන් ලබන ප්‍රතිඵල සීමා කරවයි. එමෙන්ම කෘෂි ව්‍යාප්ති සේවා සඳහා වන ආයෝජනයේ ලැබිය හැකිව තිබෙන ඵලදායිතා ප්‍රතිඵල නොලැබී යයි. එය දිගුකාලීන තිරසාර කෘෂි සංවර්ධනයකට බලපෑම් ඇති කරවයි. එහෙත් ව්‍යාප්ති සේවාවල ඉල්ලුම ගැන අවශ්‍ය තත්ත්වයෙන්, අවශ්‍ය කාලයේදි, අවශ්‍ය තන්හිදි සැපයීමක් කරන්නේ නම් එය එම ආයෝජනයේ වියදම්වල ඵලදායිතාව වැඩි කරමින් තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයකට මහ පෙන්වයි.

**තවද මෑත කාලයේ ලෝක ආර්ථික රටාව තුළ වෙනස්වෙමින් පවතින ආර්ථික හා වෙළඳ ප්‍රතිපත්ති දෙස බැලීමේදී ඉදිරියේදී ලංකාව වැනි රටවලට තවදුරටත් මෙවැනි සැපයුම් පදනම් කර ගත් (Supply Driven) කෘෂි ව්‍යාප්ති සේවා කොතෙක් දුරට පවත්වා ගෙන යා හැකි ද යන්න මහත් ගැටළුවක් විය හැකිය. විශෙෂයෙන් ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයේදී විශ්වකරණය (Globalization) ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ කොන්දේසි (World Trade Organisation - WTO), ගැට් - උරුගුවේ වටයේ කෘෂිකර්මය**

**සඳහා වන සම්මුතින් (GATT - Uruguay Round Agreement on Agriculture - GURAA) හා සාර්ක් කලාපීය නිදහස් වෙළදාම පිළිබඳ සම්මුතීන් (South Asian Free Trade Area - SAFTA) විශාල වශයෙන් බලපෑමක් ඇති කරවිය හැකිය. මෙම වෙනස්වන ලෝක ආර්ථික රටාව මගින් නිදහස් වෙළඳ හා ආර්ථික ප්‍රතිපත්ති මගින් වෙළඳපොළ මත පදනම්වූ කෘෂිකාර්මික ක්‍රමයක් ඇති කිරීම දිරිමත් කරවයි. මෙවැනි තීරණාත්මක අවස්ථාවක එක් අතකින් ආයෝජන සම්පත් හිඟ කමත්, අනෙක් අතින් ආයෝජනයේ සම්පත්වල කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහාත්, කෘෂිකර්මයේ ඵලදායිතාව වැඩිකර ගැනීම සඳහාත්, සාම්ප්‍රදායික සැපයුම් පදනම් කර ගත් ව්‍යාප්ති සේවාවන්වලින් බැහැරවීමත්, ඉල්ලුම මත පදනම් වූ ව්‍යාප්ති සේවාවක් ඇති කිරීමත් ඉතාමත් අත්‍යාවශ්‍ය ප්‍රතිපත්තියක් බව කිව යුතුය.**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මෑත කාලීන පර්යේෂණ අත්දැකීම් අනුව ලංකාවේ නිදහස් ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසුව විශේෂයෙන් ආර්ථිකයේ කර්මාන්ත හා සේවා අංශවලට සාපේක්ෂව කෘෂි අංශයේ තාක්ෂණය භාවිතය, වෙළඳපොළ සඳහා වූ කෘෂි නිෂ්පාදනය, කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත, අපනයනය සඳහා වූ කෘෂි නිෂ්පාදන යනාදිය තවමත් එතරම් ප්‍රචලිත වී නැත. එයට ප්‍රධාන වශයෙන් ලංකාවේ කෘෂිකාර්මික අංශයේ පවත්නා ව්‍යුහාත්මක ප්‍රශ්න හේතු වී ඇති බව කිව යුතුය. ඉඩම් භුක්තිය පැවරීමේ ඇති යම් යම් සීමාවන් ඵලදායිතාවයේ අඩුවීම හා ග්‍රාමීය අංශයේ යටිතල පහසුකම් වැඩිදියුණු නොවීම හා ග්‍රාමීය ණයගැති භාවය ආදී හේතු අතියම් අන්දමින් කෘෂිකර්ම සංවර්ධනයට බාධාකාරී වී ඇත. තවද ඉඩම් ඒකරාශීවීමට ඉඩ හැරීමේ ප්‍රතිපත්තිවලින් ඒ සඳහා අවශ්‍ය අනුබලය ලැබී නැත. මෙසේ ග්‍රාමීය ඉඩම් මහා පරිමාණ පිරිමැසුම් ලබන තත්ත්වයට පත්වන්නේ නම්, එහිදී ඇත්ත වශයෙන්ම ව්‍යාප්ති සේවා සඳහා ද විශාල වශයෙන් ඉල්ලුමක් ඇති කරනු ඇත.

1990 දශකයේ මැත භාගයේදී හඳුන්වාදෙන ලද දෙවන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ව්‍යාපෘතිය යම් තරමක ගොවීන්ගේ අවශ්‍යතා පදනම් කරගත් සේවාවක් බව දැක්විය හැකිය. එහිදී ප්‍රාදේශීය සම්පත් ඒකරාශී කර මනා සම්බන්ධීකරණයකින් කෘෂි නිෂ්පාදකයින්ගේ ව්‍යාප්ති අවශ්‍යතා ඉටු කිරීමට උත්සාහ ගත් බව පෙනේ.

**4. යෝජනා හා නිගමන**

ඉහතින් සාකච්ඡා කරන ලද කරුණු අනුව ලෝක ආර්ථිකයේ හා ශ්‍රී ලංකා ආර්ථිකයේ යෝජිත ආර්ථික හා වෙළඳ ප්‍රතිපත්තිවලට අනුරූපව කෘෂිකාර්මික අංශයේද යම් යම් වෙනස්කම් ඇති කළ යුතුව ඇත. එහිදී කෘෂි ව්‍යාප්ති සේවයේ ඵලදායිතාව වැඩි කිරීම සඳහා පහත සඳහන් යෝජනා වැදගත් විය හැක.

**1. සාම්ප්‍රදායික සැපයුම් ක්‍රමයෙන් ඇති කරන ලද කෘෂි ව්‍යාප්ති සේවය, කෘෂි ව්‍යාප්ති අවශ්‍යතා මත පදනම් වූ සේවාවක් බවට පත් කළ යුතුය. මෙහිදී රාජ්‍ය අංශයේ මැදිහත්වීම අවශ්‍ය වන්නේ කෘෂි ව්‍යාප්ති සේවය පොදු සේවාවක් වන නිසාය. එමෙන්ම ඒ තුළින් අවශ්‍ය තත්ත්වයේ කෘෂි ව්‍යාප්ති සේවයක්, අවශ්‍ය අවස්ථාවන්හිදී, නියමිත ආයතනයක් තුළින් ලබා දීමෙන් ඒ සඳහා වන ආයෝජනයේ ඵලදායිතාවද ඉහළ යයි.**

**2. ඉල්ලුම මත පදනම් වූ කෘෂි ව්‍යාප්ති සේවයක් සඳහා උසස් තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් හා ඔවුන්ගේ කාර්ය භාරය පහසු කරවීම සඳහා ආයතනද අවශ්‍යවේ. මේ සඳහා දැනට ග්‍රාමීය මට්ටමේ පවත්නා ආයතනික ව්‍යුහයම තම කෘෂි ව්‍යාප්ති අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගත හැක. මෙම ඉල්ලුම මත පදනම් වූ කෘෂි ව්‍යාප්ති සේවය 21 වැනි සියවසේදී කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇතිවිය හැකි වෙනස්කම්වලදී කාර්යක්ෂමව ව්‍යාප්ති සේවය ලබා දෙන අතරම එමගින් කෘෂිකර්ම අංශයේ ඵලදායිතාව වැඩි කරමින් රටේ කෘෂිකාර්මික ජාතික ආදායම ඉහළ නැංවීමට ද හේතු විය හැක.**

මේ අන්දමින් සාම්ප්‍රදායික සැපයුම මත පදනම් වූ කෘෂි ව්‍යාප්ති සේවයක් වෙනුවට ඉල්ලුම මත පදනම් වූ කෘෂි නිෂ්පාදකයන්ගේ ව්‍යාප්ති අවශ්‍යතා අවශ්‍ය අවස්ථාවේදී, අවශ්‍ය තත්ත්වයෙන්, කාර්යක්ෂමව ලබාදීමට හැකිවේ. එය 21 වැනි සියවසේදී ලංකාවේ ආර්ථික සංවර්ධනය වේගවත් කරන තවත් පියවරක්ද විය හැක.